**පන්විල ප්‍රාදේශීය සභාව - 2022**
**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

පන්විල ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට පන්විල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතී,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශේෂ පත්‍ර දිනට අවසන් වී නොමැති නඩු 38 ක් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නඩු පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කටුකිතුල ප්‍රජා ශාලාව පිහිටි රු.50,000 ක ඉඩම ගිණුම්ගත කර නොතිබුණි. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වත්කම් ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ පාසල් ළමුන්ට පොත් බෙදා දීමේ කාර්යය ඉටු නොකර රු.1,500,000 ක් ණයහිමි කර තිබීම හේතුවෙන් ණයහිමියෝ රු.1,500,000 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | 2023 වර්ෂයේදී ඉටු කිරීමට කටයුතු කරන බව. | අදාළ කාල පරිච්ඡේදය තුළ කාර්යය ඉටුකළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 571(3) වගන්තිය | 2014 සිට 2019 දක්වා කාල පරිච්ඡේදයට අදාළ කාලය ඉකුත් වූ රු.134,878 ක විවිධ තැන්පතු 07 ක් නියාදනය කර නොතිබුණි. | ආදායමට ගැනීමට හෝ ගෙවීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු.301,966 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,716,823ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 1,797,100 | 2,059,507 | 2,119,971 | 1,541,363 | 1,816,450 | 3,327,506 | 1,725,178 | 1,602,327 |
| (ii) | කුලී | 2,271,600 | 2,373,290 | 1,154,160 | 4,824,700 | 2,203,565 | 4,686,950 | 1,081,380 | 3,605,570 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,446,000 | 1,647,790 | 1,675,667 | 1,145,993 | 2,872,200 | 2,195,314 | 1,021,643 | 1,173,870 |
| (iv) | වෙනත් ආදායම් | 4,981,800 | 5,335,516 | 5,266,441 | 5,323,217 | 4,900,000 | 9,879,725 | 4,625,583 | 5,254,142 |
| | | 11,496,500 | 11,416,103 | 10,216,239 | 12,835,273 | 11,792,215 | 20,089,495 | 8,453,784 | 11,635,909 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **වරිපනම් හා බදු** | | |
| (i) | සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ වරිපනම් බදු ශේෂය රු.1,062,391 ක් වූ අතර ඒ තුළ ඒකකයක වරිපනම් බදු හිඟය රු.5,000 ඉක්ම වූ වරිපනම් ඒකක 60 ක එකතුව රු.463,466 ක් විය. | ඉදිරි වර්ෂය තුළ හිඟ අයකර ගැනීමට කටයුතු සූදානම් කර ඇති බව. | පනත ප්‍රකාරව ආදායම් අයකළ යුතුය. |
| (ii) | අක්කර බදු සමීක්ෂණයක් සිදුකර බල ප්‍රදේශයේ අක්කර බදු ඒකක හඳුනාගෙන නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු.66,557 ක හිඟ අක්කර බදු අයකර නොතිබුණි. | ඉදිරි වසර තුළ සමීක්ෂණය කිරීමට හා හිඟ අය කිරීමට කටයුතු කරන බව. | සමීක්ෂණය කර හිඟ ආදායම් අයකර ගත යුතුය. |

**(ආ) කඩ කුලී**

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසාන දිනට පොදු වෙළඳ සංකීර්ණයේ හිඟ කඩ කුලිය එකතුව රු.4,777,200 ක් වූ අතර වර්ෂයට අදාල බිල් කිරීම රු.1,194,600 ක් විය. සමාලෝචිත වර්ෂය තුළ හිඟ ආදායමින් හෝ බිල් කළ ආදායමින් කිසිදු මුදලක් අයකර ගෙන නොතිබුණි. | නීත්‍යානුකූලව අදාළ හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ මුදල් අයකළ යුතුය. |

**(ඇ) බලපත්‍ර ගාස්තු**

| | | |
|---|---|---|
| කර්මාන්ත 69 කින් එකතුව රු.130,900 ක කර්මාන්ත බදු, ව්‍යාපාර බදු, වෙළඳ බලපත්‍ර හා පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගෙන නොතිබුණි. | නීතිමය ක්‍රියාමාර්ග ඔස්සේ අයකර ගැනීමට කටයුතු කරන බව. | කාලීනව අදාළ ගාස්තු අයකළ යුතුය. |

**(ඈ) වෙනත් ආදායම්**

| | | | |
|---|---|---|---|
| (i) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 (vii)(ඌ) ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ නැවතුම්පලවල් 26 කින් ත්‍රීරෝද රථ 207 ක් සඳහා රු.659,375 ක මුදලක් අයකර ගෙන නොතිබුණි. ඒ තුළ 2018 ට පෙර ත්‍රීරෝද රථ හිමිකරුවන් 79 දෙනෙකුගේ රු.214,850 ක හිඟ ශේෂයක් පැවතුණි. | අතුරු ව්‍යවස්ථාව අනුව හිඟ මුදල් අයකර ගැනීමට හා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව. | හිඟ ගාස්තු අය කළ යුතුය. |
| (ii) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට හිඟ ජල ගාස්තු ශේෂය රු.1,092,542 ක් වූ අතර, එක ඒකකය ජල ගාස්තු හිඟය රු.5,000 ඉක්මවූ ජල පාරිභෝගික ඒකක 92 කින් එකතුව රු.690,008 ක ජල ගාස්තු හිඟයන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නීත්‍යානුකූලව හිඟ අය කිරීමට කටයුතු කරන බව. | හිඟ ජල ගාස්තු අය කළ යුතුය. |
| (iii) | 2016 පෙබරවාරි 23 දිනැති අංක 1955/7 දරන අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට  රු.246,762 ක හිඟ දැන්වීම් පුවරු ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ අයකර ගැනීමට නීත්‍යානුකූල පියවර ගන්නා බව. | වර්ෂය තුළ ආදායම් අයකළ යුතුය. |
| (iv) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට පැවති හිඟ කසළ ගාස්තු රු.412,915 ක් අයකර ගෙන නොතිබුණි. | ජංගම සේවා හා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමෙන් අයකර ගන්නා බව. | -එම- |

**2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| | | |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.216,913 ක් හා මුද්දර ගාස්තු රු.3,767,000 ක් විය. | කඩිනමින් ලබා ගැනීමට කටයුතු කරන බව. | හිඟ මුද්දර ගාස්තු හා උසාවි දඩ ගෙන්වා ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ සභාවට අයත් ජල ව්‍යාපෘති 03 ක සමාලෝචිත වර්ෂයේ සිදුකර තිබුණු ජල සාම්පල් පරීක්ෂණ වාර්තාවන්ට අනුව ඊ කෝලි (E - Coli) බැක්ටීරියා සාන්ද්‍රනය 2 -630 ත් අතර හා කොලිෆෝම් (Coliform) බැක්ටීරියාව 10 – 1050 ත් අතර පරාසයක පැවතුණි. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 78 (1) වගන්තිය අනුව කටයුතු නොකර අපවිත්‍ර ජලය මහජනතාවට බෙදා හැර තිබුණි. | ක්ලෝරීන් එක් කිරීම හා නියමිත කාල සීමාව තුළ ජල සාම්පල් පරීක්ෂා කිරීමට කටයුතු කරන බව. | පිරිසිදු ජලය බෙදා හැරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ප්‍රතිපාදන මත ඉකුත් වර්ෂයේ නකල්ස් සංචාරක මධ්‍යස්ථානයේ ආගන්තුක සත්කාරක නිවහනක් ඉදිකිරීම සඳහා රු.13,087,407 කට ගිවිසුම්ගතව තිබූ අතර 2022 අප්‍රේල් වන විට රු.5,866,860 ක බිල්පත් වෙනුවෙන් රු.2,743,663 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. මෙම කර්මාන්තයේ වැඩ අතරමඟ නවතා දමා තිබුණි. මීට අමතරව ගොඩනැගිලි ඉදිකිරීම සඳහා 2017 වර්ෂයේ රු.4,404,748 ක් වැය කර ඉදිකර තිබුණු නකල්ස් බඹරැල්ල සංචාරක නිකේතනයෙන් ද කිසිදු ආදායමක් උපයා ගැනීමට කටයුතු කර තිබුණි. | ඉදිරියේදී නව ගොඩනැගිල්ලද එක්ව එම දේපලෙහි ආදායම රැස් කිරීමට කටයුතු කරන බව. | ඉදිකිරීම් වැඩ කඩිනමින් අවසන් කර ආදායම් උපයා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 02 ක එකතුව රු.4,365,834 ක් විය. ඉන් වසර 3 ත් 5 ත් අතර කාල පරාසයට අදාළ ශේෂ එකතුව රු.1,225,713 ක් හා වසර 5 කට වැඩි කාලයක් පවතින එකතුව රු.17,223ක් විය. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව. | ලැබිය යුතු මුදල් අයකර ගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ණයහිමියෝ රු.9,918,830 ක් විය. ඉන් වසර 3 ත් 5 ත් අතර කාලයට අදාළ රු.1,461,316 ක් විය. | අදාළ ගෙවීම් කඩිනමින් සිදුකිරීමට කටයුතු කරන බව. | ණයහිමි ශේෂ නිරවුල් කළ යුතුය. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **සේවක පුරප්පාඩු හා අතිරික්ත**<br>අනුමත කාර්ය මණ්ඩලය හා තත්‍ය කාර්ය මණ්ඩලය සැසඳීමේදී ඉන් තනතුරු 11ක පුරප්පාඩු 15 ක් ද එක් තනතුරක අතිරික්තතා 05ක් ද පැවතුණි. | පුරප්පාඩු සඳහා ආදාල පාර්ශවයන් දැනුවත් කර ඇති අතර අතිරික්ත කාර්ය මණ්ඩලය රාජකාරී සඳහා යොදවාගන්නා බව. | අනුමත කාර්යමණ්ඩලය අනුව අදාළ කටයුතු කළ යුතුය. |
| (ආ) | **සේවක ණය**<br>2012 වර්ෂයේ සේවය අත්හිටවූ නිලධාරියෙකුගෙන් රු.12,600 ක්ද 2020 හා 2021 වර්ෂවල මිය ගොස් ඇති සේවකයින් දෙදෙනෙකුගේ රු.311,320ක ණය ශේෂ අයකර ගෙන නොතිබුණි. | ණය පියවා ගැනීමට කටයුතු කරන බව. | ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2018 ජනවාරි 24 දිනැති අංක 2/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව රාජ්‍ය සේවකයන්ගේ ධාරිතාවය ඉහළ නැංවීම සඳහා අවම වර්ෂ දෙකකට වරක් මානව සම්පත් සංවර්ධන සැලැස්මක් හා වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කිරීම කළ යුතු වුවද එසේ කටයුතු කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ අවශ්‍ය කටයුතු කරන බව. | කාර්යසාධන ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු කළ යුතුය. |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනයේ දැක්වෙන ඇස්තමේන්තුගත ආදායම් වියදම් සඳහා තථ්‍ය ආදායම් හා වියදම් සමහ සැසඳීමේදී ආදායම් විෂයන් 27 ක සියයට 75 සිට සියයට සියය ඉක්මවූ වියදම් විෂයයන් 15 ක සියයට 74 සිට සියයට 99 දක්වා විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණි. | වඩා තාර්කික තොරතුරු ලබා ගැනීමෙන් ඵලදායී අයවැය ලේඛනයක් ඉදිරියේදී පිළියෙල කරන බව. | අවධානයෙන් හා අවශ්‍යතාවය සළකා අයවැය පිළියෙල කළ යුතුය. |

**4.2 තිරසර සංවර්ධන අරමුණු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අංක 19 දරන තිරසර සංවර්ධන පනතේ නියමයන්ට අනුව සභාව විසින් තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගෙන තිබුණද ඒවා ලඟාකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී අදාළ කටයුතු ඉටුකරන බව. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගෙන ඒවා ලඟා කර ගැනීමට හා දර්ශක හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය. |